# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1637/25 – 2010 ජනවාරි 22 වැනි සිකුරාදා – 2010.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 04/03/01/05.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2007/එච්ඩබ්ලිව්/310.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මුංවත්තහාග පත්තුව සුළු කොට්ඨාසයේ ඉහළ කරන්නාගොඩ ගමේ 811බී, ඉහළ කරන්නාගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි. ක. 4164 හි කැබලි අංක 01, 02, 03, 04 සහ 05 ලෙස දැක්වෙන පහත සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.2495 ක් වූ වෙරළුගස්තොටුපල නමැති ඉඩම් කොටස් පහ (05):

**කැබලි අංක 01**
ඉඩමේ නම: වෙරළුගස්තොටුපල; මුල් හිමිකම් කියන අය: ටී. එල්. ඩී. ගිහාන් ධම්මික, වෙරළුගස්තොටුපල; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0055.

**කැබලි අංක 02**
ඉඩමේ නම: වෙරළුගස්තොටුපල; මුල් හිමිකම් කියන අය: ටී. එල්. ඒ. අජිත්, වෙරළුගස්තොටුපල, ඉහළ කරන්නාගොඩ; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0080.

**කැබලි අංක 03**
ඉඩමේ නම: වෙරළුගස්තොටුපල; මුල් හිමිකම් කියන අය: නොදනී; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.1067.

**කැබලි අංක 04**
ඉඩමේ නම: වෙරළුගස්තොටුපල; මුල් හිමිකම් කියන අය: නොදනී; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0719.

**කැබලි අංක 05**
ඉඩමේ නම: වෙරළුගස්තොටුපල; මුල් හිමිකම් කියන අය: නොදනී; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0574.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 මාර්තු මස 22 වැනි දින පෙ.ව. 10.00ට මදුරාවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2010 මාර්තු මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එම්. ඒ. ටී. සෙනරත්,
ප්‍රාදේශිය ලේකම්,
මදුරාවල.

2010 ජනවාරි මස 20 වැනි දින,
මදුරාවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී ය.

02 – 159

1A – G12357 – 400 (2010/01)

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 03/කටා/ඉඅත්/71.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2008/පීජ්/202.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙයින් දැනුම් දි සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ දාසියපත්තුව සුළු කොට්ඨාසයේ ආඩිඅම්බලම ගමේ පිහිටි, ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කරන ලද අංක මු.පි. ගම්. 3723 දරන පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් සඳහන් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 2.2635 ක් වූ බංගලාගොඩැල්ල නමැති ඉඩම් කොටස් දෙක (02):

කැබලි අංක 01
ඉඩමේ නම: පුද්ගලික පාර; විස්තරය: පුද්ගලික පාර; හිමිකම් කියන අය: එස්. ඒ. ඊ. ක්‍රිෂාන් සිල්වා, අංක 117, මිනුවන්ගොඩ පාර, ආඩිඅම්බලම; ප්‍රමාණය: හෙක්. 0.0259.

කැබලි අංක 02
ඉඩමේ නම: බංගලාගොඩැල්ල; විස්තරය: ළඳු කැලය සහිත ඉඩම, ස්ථිර මුරකුටියක් ඇත; හිමිකම් කියන අය: එස්. ඒ. ඊ. ක්‍රිෂාන් සිල්වා, අංක 117, මිනුවන්ගොඩ පාර, ආඩිඅම්බලම ; ප්‍රමාණය: හෙක්. 2.2376.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 මාර්තු මස 10 වැනි දින පෙ.ව. 9.30 ට කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හමු විය යුතුයි.

තවද 2010 පෙබරවාරි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එම්. එච්. ජී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2010 ජනවාරි මස 21 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 – 160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී